# 2026 මැයි මස 14 දින වත්තේගම නගර සභා රැස්වීම් ශාලාවේ දී පැවති මහා සභා වාර්තාව

- **සහභාගී වීම**

| | |
|---|---|
| 1. ඩී.එස්. උයන්ගොඩ මැතිතුමා | - ගරු සභාපති |
| 2. ජේ.ඒ.යූ. ගමගේ මැතිතුමා | - ගරු උප සභාපති |
| 3. එච්. ප්‍රියන්ත පුෂ්ප කුමාර මැතිතුමා | - ගරු නගර සභා මන්ත්‍රී |
| 4. ඒ.එම්. මොනිකා අබේකෝන් මැතිනිය | - ගරු නගර සභා මන්ත්‍රී |
| 5. ඩී.පී.ඩබ්.ජී අනුර කුමාර මැතිතුමා | - ගරු නගර සභා මන්ත්‍රී |
| 6. සී.ඩී. ගුරුගල්ගේ මැතිතුමා | - ගරු නගර සභා මන්ත්‍රී |
| 7. බී.ඒ.දුමින්ද පෙරේරා මැතිතුමා | - ගරු නගර සභා මන්ත්‍රී |
| 8. ර්.ජී.ජේ. ආරියවංශ මැතිතුමා | - ගරු නගර සභා මන්ත්‍රී |
| 9. ඒ.ජී.ආර්. ගුණවර්ධන මැතිතුමා | - ගරු නගර සභා මන්ත්‍රී |
| 10. ආර්.ජී.යූ.සෙතානී රාජමන්ත්‍රී මැතිතුමා | - ගරු නගර සභා මන්ත්‍රී |
| 11. ඩී.ඩබ්.ආර්.ඩබ්.එම්.එම්.ඩබ්.ජී. එන්.විජේනායක මැතිතුමා | - ගරු නගර සභා මන්ත්‍රී |
| 12. ඩී.ජී.එස්. විජේසූරිය මැතිනිය | - ගරු නගර සභා මන්ත්‍රී |
| 13. අයි.එම්.එස්.ආර්. රණසිංහ මැතිනිය | - ගරු නගර සභා මන්ත්‍රී |
| 14. ඒ.ජී.කේ. රොෂාන් ජයවීර මැතිතුමා | - ගරු නගර සභා මන්ත්‍රී |
| 15. ඩබ්.ටී. රාජමන්ත්‍රී මැතිතුමා | - ගරු නගර සභා මන්ත්‍රී |
| 16. ඩබ්.එම්.ඒ.බී. විරකෝන් මැතිතුමා | - ගරු නගර සභා මන්ත්‍රී |
| 17. වී.බී.වස්ගේවත්ත මහතා | - ලේකම් |

- සහභාගී නොවීම - නැත

ගරු සභාපති ඩී.එස්. උයන්ගොඩ මහතාගේ ප්‍රධානත්වයෙන් න්‍යාය පත්‍රයට අනුව සභාවේ කටයුතු පෙ.ව 10. 00 ට ආරම්භ විය.

**(අ) 2026.04.09 දින පසුගිය මහා සභා වාර්තාව ස්ථිර කිරිම.**

න්‍යායපත්‍රානුකූලව මුලින්ම ඇත්තේ 2026.04.09 දින පැවති මහා සභා වාර්තාව ස්ථිර කර ගැනීමයි. ඒ අනුව එම වාර්ථාවේ සංශෝධන කිසිවක් ඇත්නම් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා යෝජනා කරන ලදි.

ඒ අනුව අදාල වාර්තාවේ (ඹ).4.5 හි ඇති "මෙම යන්ත්‍රය විකිනීම සුදුසු බව" යන්න "මෙම යන්ත්‍රය ඉවත් කිරීම සුදුසු බව" ලෙස සංශෝධනය විය යුතු බවට ගරු නගර සභා මන්ත්‍රි ඒ.ජී.ආර් ගුණවර්ධන මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

ගරු සභාපතිතුමනි මා විසින් ප්‍රකාශ කළ තොරතුරු වගයක් මඟ හැරී තිබෙනවා. ඒ අනුව (ඹ) 4.8 හි "මොකද මේ මාසේ තමා එයාල ව්‍යාපාරයක් කරලා ආදායම් උපයා ගන්නේ" යන්න "නගරයේ තියෙන අනෙකුත් ව්‍යාපාරිකයින් හට මේක ප්‍රශ්ණයක් වෙනවා ලෙස" වෙනස් විය යුතු බවට ගරු නගර සභා මන්ත්‍රි ඩී.ඩබ්.ආර්.ඩබ්.එම්.එම්.ඩබ්.ජී. එන්.විජේනායක මැතිතුමා විසින් පවසන ලදි.

ඒ අනුව 2026.04.09 දින පැවති මහා සභා රැස්වීම වාර්තාව ඉහත සඳහන් සංශෝදන වලට යටත්ව ස්ථිර කිරීම සුදුසු බවට ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා විසින් යෝජනා කල අතර එම යෝජනාව ගරු නගර සභා මන්ත්‍රි ඒ.ජී.ආර් ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**ඒ අනුව ඉහත සඳහන් සංශෝධනයට යටත්ව 2026.04.14 දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව ස්ථිර කරන ලදි.**

(ඉ) නගර සභාව අමතා එවන ලද ලිපි ,පෙත්සම් ,පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම

(උ) විධිවූ පරිදි කලින් එවා තිබෙන ප්‍රශ්ණ - **නැත**

(එ) විධිවූ පිරිධි කලින් එවා තිබෙන යෝජනා

**<u>1. ගරු සභාපති ඩී.එස් .උයන්ගොඩ මහතාගේ යෝජනා</u>**

1 ජාතික විගණන උප කාර්යාලය මගින් යොමු කර ඇති 2026.03.17 දිනැති විගණන විමසුමට 2026.04.10 දින විගණන උප කාර්යාලය වෙත අප විසින් යොමු කරන ලද පිළිතුරු මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා නිර්දේශය මත ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදි (මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්ථාවේ ඇමුණුමක් ලෙස අමුණා ඇත).

1.1.1 ඉහත යෝජනාව ගරු නගර සභා උප සභාපති ජේ.ඒ.යූ. ගමගේ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

1.1.2 ඉන් අනතුරුව විවාද අවස්තාව එළඹි අතර එම අවස්ථාවේදී මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්ථාවේ ඇමුණුම් වල දෘඩ පිටපතක් ඊලඟ සභාවේදී ලබා දීමට කටයුතු කරන ලෙස ගරු නගර සභා මන්ත්‍රී ඒ.එම්.එම් අබේකෝන් මැතිනිය විසින් පවසන ලදි.

1.1.3 අනතුරුව ගරු නගර සභා උප සභාපති ජේ.ඒ.යූ. ගමගේ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**1.1.1 ඒ අනුව ඉහත සඳහන් ජාතික විගණන උප කාර්යාලය මගින් යොමු කර ඇති 2026.03.17 දිනැති විගණන විමසුමට 2026.04.10 දින විගණන උප කාර්යාලය වෙත යොමු කරන ලදි පිළිතුර පිළිබඳ යෝජනාව සියළුම සභිකයින් ඒකමතිකව සම්මත කරන ලදි.**

2. ජාතික විගණන කාර්යාලය මගින් යොමු කර ඇති 2026.04.20 දිනැති වත්තේගම නගර සභාවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වු මුල්‍ය ප්‍රකාශන පිළිබඳ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 11 (1) උප වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා නිර්දේශයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදි . (මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්ථාවේ ඇමුණුමක් ලෙස අමුණා ඇත).

1.2.1 ඉහත යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී බී.ඒ.ඩී පෙරේරා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

1.2.2 ඉන් අනතුරුව විවාද අවස්තාව එළඹි අතර එම අවස්ථාව කිසිවෙකුත් ලබා නොගන්නා ලදි.

**1.2.1 ඒ අනුව ඉහත සඳහන් ජාතික විගණන කාර්යාලය මගින් යොමු කර ඇති 2026.04.20 දිනැති වත්තේගම නගර සභාවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වු මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 11 (1) උප වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව ගරු මහා සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදි.**

3. වත්තේගම නගර සභාව විසින් මාසිකව රැස් කරනු ලබන කසළ ගාස්තු සඳහා මේ වන විට ලිපි මගින් වෙළඳ ප්‍රජාව දැනුවත් කරන අතර ඒ සඳහා සැලකිය යුතු කාලයක් වැය කළ යුතු බැවින් කසළ ගාස්තු අය කිරීම දැනුවත් කිරීම සඳහා පිටපත් දෙකකින් යුතුව බිල්පොතක් සකස් කර ගැනීමට පරිසර කමිටු නිරදේශ යටතේ මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා නිර්දේශය මත ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදි.

1.3.1 ඉහත යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී බී.ඒ.ඩී පෙරේරා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

1.3.2 ඉන් අනතුරුව විවාද අවස්තාව එළඹි අතර එම අවස්ථාව කිසිවෙකුත් ලබා නොගන්නා ලදි.

**1.3.3 ඒ අනුව ඉහත සඳහන් වත්තේගම නගර සභාව විසින් මාසිකව රැස් කරනු ලබන කසළ ගාස්තු සඳහා පිටපත් දෙකකින් යුතුව බිල්පොතක් සකස් කිරීමේ යෝජනාව සියළුම සභිකයින් ඒකමතිකව සම්මත කරන ලදි.**

4. පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් යොමු කරන ලද මධ්‍යම පළාත් නගර අලංකරණ වැඩසටහන යටතේ හොඳම ළමා උද්‍යානය වත්තේගම නගර සභා ළමා උද්‍යානය බවට සංවර්ධනය කිරීමට පරිසර කමිටු නිර්දේශ අනුව මුදල් හා ප්‍රතිපත්ති කාරක නිර්දේශය මත ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදි.

1.4.1 ඉහත යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී බී.ඒ.ඩී පෙරේරා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

1.4.2 ඉන් අනතුරුව විවාද අවස්තාව එළඹි අතර එම අවස්ථාව කිසිවෙකුත් ලබා නොගන්නා ලදි.

1.4.3 **ඒ අනුව ඉහත සඳහන් පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් යොමු කරන ලද මධ්‍යම පළාත් නගර අලංකරණ වැඩසටහන යටතේ හොඳම ළමා උද්‍යානය වත්තේගම නගර සභා ළමා උද්‍යානය බවට සංවර්ධනය කිරීමේ යෝජනාව සියළුම සභිකයින් ඒකමතිකව සම්මත කරන ලදි.**

5. වත්තේගම නගර සභා කාර්යාලයේ ඡායා පිටපත් යන්ත්‍රය අක්‍රිය වී ඇති අතර නැවත අළුත්වැඩියා කිරීමට නොහැකි බැවින් නව ඡායා පිටපත් යන්ත්‍රයක් මිලදී ගැනීම සුදුසු බවට යෝජනා කරමි.

1.5.1 ඉහත යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ආර්.ජී.යු.ආර්.එස් රාජමන්ත්‍රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

1.5.2 ඉන් අනතුරුව විවාද අවස්තාව එළඹි අතර එම අවස්ථාව කිසිවෙකුත් ලබා නොගන්නා ලදි.

1.5.3 **ඒ අනුව ඉහත සඳහන් නව ඡායා පිටපත් යන්ත්‍රයක් මිලදී ගැනීමේ යෝජනාව සියළුම සභිකයින් ඒකමතිකව සම්මත කරන ලදි.**

6. මියන්පහේවත්ත කසළ අංගනය වෙත භාහිර පුද්ගලයන් පැමිණ කසළ බැහැර කිරීම නිරීක්ෂණ වීම හේතුවෙන් කසළ අංගනය සඳහා ගේට්ටුවක් සකස් කර සවි කිරීමට පරිසර කමිටු නිර්දේශය මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා නිර්දේශය මත ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදි.

1.6.1 ඉහත යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ආර්.ජී.යූ.ආර්.එස් රාජමන්ත්‍රී මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

1.6.2 ඉන් අනතුරුව විවාද අවස්තාව එළඹි අතර එම අවස්ථාව කිසිවෙකුත් ලබා නොගත්තා ලදි.

1.6.3 **ඒ අනුව මියන්පහේවත්ත කසළ අංගනය වෙත භාහිර පුද්ගලයන් පැමිණ කසළ බැහැර කිරීම හේතුවෙන් කසළ අංගනය සඳහා ගේට්ටුවක් සකස් කර ගැනීමේ යෝජනාව සියළුම සභිකයින් ඒකමතිකව සම්මත කරන ලදි.**

1. වත්තේගම ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිළධාරි විසින් ගරු සභාපතිතුමා වෙත යොමු කරන ලද 4/43/ගො/සේ/ම/වත්තේගම හා 2026.04.22 දිනැති ලිපිය අනුව 2026 වර්ෂයේ සිට අයකළ යුතු කසළ ගාස්තු ගෙවීම අසීරු වී අති බැවින් ඒ සඳහා ගාස්තු ඉවත් කර දෙන ලෙස ඉල්ලීම් කරන ලද ඉල්ලීම ලිපිය මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා නිර්දේශය මත ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදි. ( ඔවුන් විසින් ගෙවිය යුතු කසළ ගාස්තු සාරාංශය පහත පරිදි වේ)

**කසළ ගාස්තු - 2026**

| **මාසය** | **ස්ථානය** | **කසළ ගාස්තුව (.රු)** |
|---|---|---|
| ජනවාරි | ගොවිජන සේවා මධ්‍යස්ථානය | 800.00 |
| | හෙල බොජුන් හල | 4,110.00 |
| පෙබරවාරි | හෙල බොජුන් හල | 2,950.00 |
| | සිතමු කාන්තා ගොවි සමිතිය | 1,130.00 |
| මාර්තු | ගොවිජන සේවා මධ්‍යස්ථානය | 2,810.00 |
| මුළු එකතුව | | රු .11,800.00 |

**ස්ථාන අනුව සාරාංශය )Summary by Location)**

- **හෙල බොජුන් හල** : රු .7,060.00
- **ගොවිජන සේවා මධ්‍යස්ථානය** : රු .3,610.00
- **සිතමු කාන්තා ගොවි සමිතිය** :රු .1,130.00

1.7.1 ඉහත යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී සී.ඩී ගුරුගල්ගේ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

1.7.2 ඉන් අනතුරුව විවාද අවස්තාව එළඹි අතර එම අවස්ථාවේදී ගරු නගර සභා උප සභාපති ජේ.ඒ.යූ ගමගේ මැතිතුමා විසින් පවසන ලද්දේ, මෙම කරුණ මහා සභාවේ කථා කිරීම අනවශ්‍ය බවය.

1.7.3 ඒ අනුව ගරු නගර සභා මන්ත්‍රී සී.ඩී ගුරුගල්ගේ මැතිතුමා විසින් මෙම යෝජනාව ප්‍රතික්ශේප කරන ලදි.

1.7.4 **ඒ අනුව ඉහත සඳහන් ආයතනයන්ගේ කසල ගාස්තු අය නොකරන ලෙස කරන ලද යෝජනාව සියළුම සභිකයින් ඒකමතිකව ප්‍රතික්ශේප කරන ලදි.**

8. වත්තේගම නගර සභාවට අයත් රාස්ඇල්ල ජල යෝජනා ක්‍රමය, ආදාහනාගාරය හා කාර්යාල පරිශ්‍රයේ අධීක්ෂණ කටයුතු පහසු වීම සඳහා ආරක්ෂිත කැමරා පද්ධතියක් ස්ථාපනය කිරීම සුදුසු බවට වැඩ අධිකාරි විසින් ඉදිරිපත් කර ඇති ඉල්ලීම් ලිපිය මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා නිර්දේශය මත ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදි.

1.8.1 ඉහත යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී බී.ඒ.ඩී පෙරේරා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

1.8.2 ඉන් අනතුරුව විවාද අවස්තාව එළඹි අතර එම අවස්ථාවේදී ගරු නගර සභා උප සභාපති ජේ.ඒ.යූ ගමගේ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලද්දේ මෙය ඉතාම හොද යෝජනාවක් වන බවත් මෙමගින් රාස්සැල්ල ජල ව්‍යාපෘතියේ සිදුවන්නේ මොනවාද යන්න බලා ගැනීමේ හැකියාවක් ඇති බවත්ය.

1.8.3 ඒ අනුව ගරු නගර සභා මන්ත්‍රී බී.ඒ.ඩී පෙරේරා මැතිතුමා මෙම යෝජනාව ස්ථිර කරන ලදි.

1.8.4 **ඒ අනුව වත්තේගම නගර සභාවට අයත් රාස්ඇල්ල ජල යෝජනා ක්‍රමය, ආදාහනාගාරය හා කාර්යාල පරිශ්‍රයේ අධීක්ෂණ කටයුතු පහසු වීම සඳහා ආරක්ෂිත කැමරා පද්ධතියක් ස්ථාපනය කිරීම කරන ලද යෝජනාව සියළුම සභිකයින් ඒකමතිකව සම්මත කරන ලදි.**

9. වත්තේගම නගර සභා කාර්යාලය තුල නිලධාරීන් සම්බන්ධීකරණය පහසුවීම සඳහා අභ්‍යන්තර දුරකථන පද්ධතියක් ස්ථාපනය කිරීම සුදුසු වන හෙයින් එම කාර්යය ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය මගින් ඉටු කරවා ගැනීමට වැඩ අධිකාරි විසින් ඉදිරිපත් කර ඇති ඉල්ලීම් ලිපිය මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා නිර්දේශය මත ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදි.

1.9.1 ඉහත යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී අයි.එම්.එස්.ආර්. රණසිංහ මැතිනිය විසින් ස්ථිර කරන ලදි.

1.9.2 ඉන් අනතුරුව විවාද අවස්තාව එළඹි අතර එම අවස්ථාවේදී ගරු නගර සභා උප සභාපති ජේ.ඒ.යූ ගමගේ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලද්දේ මෙය ඉතාම හොද යෝජනාවක් වන බවත් නමුත් දුරකතනයට ප්‍රතිචාර දැක්වීමේදී මනා සංයමයකින් යුතුව පිළිතුරු ලබා දීමට වග බලා ගන්නා ලෙස මම ඉල්ලා සිටිනවා.

1.9.3 ඒ අනුව ගරු නගර සභා උප සභාපති ජේ.ඒ.යූ ගමගේ මැතිතුමා මෙම යෝජනාව ස්ථිර කරන ලදි.

1.9.4 **ඒ අනුව ත්තේගම නගර සභාවේ අභ්‍යන්තර දුරකතන පද්දතියක් ස්ථාපිත කිරීමේ යෝජනාව සියළුම සභිකයින් ඒකමතිකව සම්මත කරන ලදි.**

10. පුංචිමෝල ජල යෝජනා ක්‍රමයේ ජල ටැංකිය ස්ථාපනය කිරීම සඳහා ලබාදුන් පර්චස් 20 ඉඩම් කොටස වෙනුවෙන් සකස් කරන ලද පිඹුරුපත් 03 සඳහා ගෙවිය යුතු රු. 54,000.00 ක බිල්පත ගෙවීම් අනුමැතියට මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා නිර්දේශය මත ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදි.

1.10.1 ඉහත යෝජනාව ගරු නගර සභා උප සභාපති ජේ.ඒ.යූ ගමගේ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

1.10.2 ඉන් අනතුරුව විවාද අවස්තාව එළඹි අතර එම අවස්ථාව කිසිවෙකුත් ලබා නොගන්නා ලදි.

**ඒ අනුව ඉහත පුංචිමෝල ජල යෝජනා ක්‍රමයේ ජල ටැංකිය ස්ථාපනය කිරීම සඳහා ලබාදුන් පර්චස් 20 ඉඩම් කොටස වෙනුවෙන් සකස් කරන ලද පිඹුරුපත් 03 සඳහා ගෙවිය යුතු රු. 54,000.00 ක බිල්පත ගෙවීම් කිරීමේ යෝජනාව සියළුම සභිකයින් ඒකමතිකව සම්මත කරන ලදි.**

11. වත්තේගම නගර සභාවේ භාවිතා කරනු ලබන වැසිකිළි වලවල් වලින් හමන දුර්ගනධය හේතුවෙන් ගලි බවුසරයක් ගෙනවිත් වලවල් අස් කිරිම සඳහා අනුමැතියට මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා නිර්දේශයට අනුව දින 2026.04.26සිදු කල බව ගරු මහා සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදි.

1.11.1 ඉහත යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී බී.ඒ.ඩී පෙරේරා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

1.11.2 ඉන් අනතුරුව විවාද අවස්තාව එළඹි අතර එම අවස්ථාව කිසිවෙකුත් ලබා නොගන්නා ලදි.

1.11.3 **ඒ අනුව ඉහත වත්තේගම නගර සභාවේ වැසිකිලි වලවල් ගලි බවුසරයක් ගෙනවිත් අස් කිරීමේ යෝජනාව සියළුම සභිකයින් ඒකමතිකව සම්මත කරන ලදි.**

12. වත්තේගම නගර සීමාව තුල ජංගම රථයක තබාගෙන මාළු අලෙවි කිරීම සඳහා අවසර ලබා දෙන මෙන් 2026.04.20 දින වත්තේගම, කුඩුගල පාර,අංක 21/4, එල්.එච් අයිරාංගනී මිය විසින් කරන ලද ඉල්ලීම මහා සභාවට ඉදිරිපත් කර සමස්තයක් ලෙස තීරණයක් ගැනීමට මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා නිර්දේශය මත ගරු මහා සභාව ඉදිරිපත් කරන ලදි.

1.12.1 ඉහත යෝජනාව ගරු නගර සභා උප සභාපති ජේ.ඒ.යූ ගමගේ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

1.12.2 ඉන් අනතුරුව විවාද අවස්තාව එළඹි අතර එම අවස්ථාවේදී ගරු නගර සභා මන්ත්‍රී ඒ.එම්.එම් අබේකෝන් මැතිනිය විසින් ප්‍රකාශ කරන ලද්දේ පෙර මාළු කඩය පැවති ස්ථානයේ මෙම ජංගම අලෙවිසැල යොදා ගැනීමට අවස්ථාව නොදෙන ලෙසත්, ඉරිදා

දිනයට සති පොළටත් අනෙකුත් දිනයන්හිදී පොදු වෙළඳ පොළටත් ලෙස මෙම ජංගම මාළු වෙළඳ සැල් ගෙනියන්න කියලා මම යෝජනා කරනවා.

1.12.3 අනතුරුව ගරු නගර සභා මන්ත්‍රී ඒ.ජී.කේ. රොෂාන් ජයවීර මැතිතුමා විසින් පවසන ලද්දේ මෙම ව්‍යාපාරිකයන් සඳහා අවස්ථාව ලබා දී ඇත්තේ වාහනය තුළ තබා ගෙන වෙළඳාම් කිරීමට වුවත් ඔවුන් වාහනයෙන් ඉවතට ගෙන පාරේ තමා වෙළඳාම කරන්නේ.

1.12.4 ඒ අනුව ගරු නගර සභා සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා විසින් වත්තේගමකුඩුගල , 21 අංක,පාර/4, එල්එච් අය.ිරාංගනී මිය විසින් කරන ලද ඉල්ලීම් ලිපිය සභාව හමුවේ කියවන ලදි.

1.12.5 ගරු නගර සභා මන්ත්‍රී ඩී.ඩබ්.ආර්.ඩබ්.එම්.එම්.ඩබ්.ජී. එන්.විජේනායක මැතිතුමා විසින් පවසන ලද්දේ ලබා දී ඇති ඉල්ලීමට අනුව අවස්ථාව ලබා දී කටයුතු කරන ලෙසත් ඉල්ලීමට අනුවම කටයුතු කරනවාද යන්න පිළිබඳව අධීක්ෂණය කරන ලෙසත් මම යෝජනා කරනවා.

1.12.6 පසුව මෙම මහා සභාව ගරු නගර සභා උප සභාපති ජේ.ඒ.යූ ගමගේ මැතිතුමා විසින් කාරක සභාවක් බවට පත් කළ අතර එම යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී බි .ඒ .ඩී පෙරේරා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

1.12.7 එම කාරක සභා අවස්ථාවේදී ලේකම් වී.බී වස්ගේවත්ත මහතා විසින් කරුණු පැහැදිලි කිරීමක් සිදු කල අතර 2026.05.21 දින ප.ව2.00 ට මේ පිළිබඳව පදික වෙළෙන්දන් සමඟ සභාපති ඇතුළු මන්ත්‍රී මණ්ඩලය විසින් සාකච්ඡාවක් පැවැත්වීමටද තීරණය කරන ලදි.

1.12.8 අනතුරුව කාරක සභාව, මහා සභාවක් කිරීමට ගරු නගර සභා මන්ත්‍රී එච්. ප්‍රියන්ත පුෂ්පකුමාර මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනවා ගරු නගර සභා මන්ත්‍රී ඒ.ජී.කේ. රොෂාන් ජයවීර මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

1.12.9 මෙම යෝජනාව ගරු නගර සභා උප සභාපති ජේ.ඒ.යූ ගමගේ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

1.12.10 **ඒ අනුව වත්තේගම, කුඩුගල පාර, අංක 21/4 පදිංචි එල්.එච්. අයිරාංගනී මිය විසින් කරන ලද ඉල්ලීමට අනුව රථයක් තුළ තබාගෙන අදාල කොන්දේසි වලට යටත්ව ජංගම රථයක් තුල මාළු වෙළඳාම් කිරීම පිළිබඳ යෝජනාව සියළුම සභිකයින් ඒකමතිකව සම්මත කරන ලදි.**

13. 2025 වර්ෂය සඳහා ලබාදුන් පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන,උපමාන පාදක ප්‍රදාන නඩත්තු යටතේ පොදු වැසිකිලි පද්දතිය සංවර්ධනය කිරීම සඳහා නිර්දේශිත අරමුදල් ප්‍රමාණවත් නොවන බැවින් අතිරේකව දැරීමට සිදුවන රු.මි 05ක මුදල සභා අරමුදලින් දැරීමට මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා නිර්දේශය මත ගරු මහා සභාව වෙත ඉදිරිපත් කරන ලදි.

1.13.1 ඉහත යෝජනාව ගරු නගර සභා උප සභාපති ජේ.ඒ.යූ ගමගේ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

1.13.2 ඉන් අනතුරුව විවාද අවස්තාව එළඹි අතර එම අවස්ථාවේදී ගරු නගර සභා මන්ත්‍රී ඩී.ඩබ්.ආර්.ඩබ්.එම්.එම්.ඩබ්.ජී. එන්.විජේනායක මැතිතුමා විසින් විමසන ලද්දේ නගර සභාව විසින් යොදවන ලද මෙම මුදල් නැවත ලැබෙන්නේ කෙසේද යන්නත් ඒ පිළිබඳව ලිඛිතව ලියවිල්ලක් මඟින් දැනුම් දීමක් සිදුකර නොමැති බැවින් මෙම මුදල් අයවීම පිළිබඳව ගැටළුවක් ඇති බවත් එමෙන්ම සභා අරමුදල් ප්‍රතිපූර්ණය වීම පිලිබඳව ගැටළුවක් ඇති බැවින් හා මෙම පොදු වැසිකිලිය අත්‍යාවශ්‍ය වන බැවින් පොදු තීරණයක් ගැනීම සුදුසු බවට යෝජනා කරන ලදි.

1.13.3 ඒ අනුව ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා විසින් පවසන ලද්දේ මෙම මුදල් පළාත් සභා අරමුදලින් හෝ මධ්‍යම රජයේ අරමුදලින් ලබා ගැනීමේ හැකියාව ඇති බවත්ය. මේ වන විට 2026 වර්ෂයට ගෙවීම් සිදු කර අවසන්ව ඇති අතර නැවත ගෙවීම් කරන පළමු අවස්ථාවේදීම මෙම වෙන් කිරීම සිදු කර ගැනීමේ හැකියාව ඇති බවත්ය.

1.13.4 ඒ අනුව වැඩිදුරටත් සාකච්ඡා කිරීම සඳහා මෙම මහා සභාව කාරක සභාවක් කිරීම සුදුසු බවට ගරු නගර සභා මන්ත්‍රී ඒ.එම්.එම් අබේකෝන් මැතිනිය විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඒ.ජී.කේ.ආර් ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

1.13.5 කාරක සභා අවස්ථාවේදී ලේකම් වී.බී වස්ගේවත්ත මහතා හා වැඩ අධිකාරී එස්.එම්.ඊ.සී.බී සමරකෝන් මහතා විසින් පැහැදිලි කිරීමක් සිදු කරන ලදි.

1.13.6 අනතුරුව කාරක සභාව, මහා සභාවක් කිරීම සඳහා ගරු නගර සභා මන්ත්‍රී බී.ඒ.ඩී පෙරේරා මැතිතුමා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ටී රාජමන්ත්‍රී මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි

1.13.7 ඒ අනුව ඉහත පොදු වැසිකිලි පද්ධතිය සංවර්ධනය කිරීම සඳහා අතිරේකව දැරීමට සිදුවන රු.මි 05 ක මුදල සභා අරමුදලින් දැරීමේ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඩබ්. රාජමන්ත්‍රී මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

01.14.1**2025 වර්ෂය සඳහා ලබාදුන් පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන,උපමාන පාදක ප්‍රදාන නඩත්තු යටතේ පොදු වැසිකිලි පද්දතිය සංවර්ධනය කිරීම සඳහා නිර්දේශිත අරමුදල් ප්‍රමාණවත් නොවන බැවින් අතිරේකව දැරීමට සිදුවන රු.මි 05 මුදල් වත්තේගම නගර සභා අරමුදලින් දැරීමේ යෝජනාව සියළුම සභිකයින් ඒකමතිකව සම්මත කරන ලදි.**

14. ඇස්තමේන්තු හා ව්‍යුහාත්මක සැලැසුම් සකස් කරවා ගැනීමට ඉංජිනේරු කාර්යන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය මඟින් (CECB) ඉටු කරවා ගැනීමට ජාතික ප්‍රසම්පාදන කොමිශන් සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා නිර්දේශය මත ගරු මහා සභාව වෙත ඉදිරිපත් කරන ලදි.

01.14.2 ඉහත යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී සී. ඩී ගුරුගල්ගේ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

01.14.3 ඉන් අනතුරුව විවාද අවස්තාව එළඹි අතර එම අවස්ථාව කිසිවෙකු විසින් ලබා නොගන්නා ලදි.

01.14.4 **ඒ අනුව ඉහත සඳහන් ඇස්තමේන්තු හා ව්‍යුහාත්මක සැලැසුම් සකස් කරවා ගැනීමට ඉංජිනේරු කාර්යන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය මඟින් (CECB) ඉටු කරවා ගැනීමට ජාතික ප්‍රසම්පාදන කොමිශන් සභාවේ අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව සියළුම සභිකයින් ඒකමතිකව සම්මත කරන ලදි.**

15. සතිපොළ පැවැත්වෙන ස්ථානයට විදුලි සැපයුම ලබා ගැනීම සඳහා වන යෝජනාව, මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා නිර්දේශය මත ගරු මහා සභාව වෙත ඉදිරිපත් කරන ලදි.

1.15.1 ඉහත යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී බී.ඒ.ඩී පෙරේරා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

1.15.2 ඉන් අනතුරුව විවාද අවස්තාව එළඹී අතර එම අවස්ථාව කිසිවෙකු විසින් ලබා නොගන්නා ලදි.

1.15.3 **ඒ අනුව ඉහත සඳහන් සතිපොළ පැවැත්වෙන ස්ථානයට විදුලි සැපයුම ලබා දීමේ යෝජනාව සියළුම සභිකයින් ඒකමතිකව සම්මත කරන ලදි.**

16. වත්තේගම නගර සභාවේ වැඩ අධිකාරී විසින් සකස් කරන ලද පහත සඳහන් ඇස්තමේන්තු මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේ නිර්දේශය මත ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදි

| | කර්මාන්තය | ඇස්තමේන්තු වටිනාකම ( රු.) |
|---|---|---|
| 01 | වත්තේගම නගර සභාවේ මහජන පුස්තකාලයේ තීන්ත ආලේප කිරිම. | 550,000.00 |
| 02 | ඇල්කඩුව පාරේ සිට වරකාගස්තැන්න දක්වා වන මාර්ගය පළල අඩි 06 ක් වනසේ කොන්ක්‍රීට් කිරීම. | 400,000.00 |
| 03 | අරලියලන්ද පාරේ නායගිය ස්ථාන සඳහා පැතිකාණු හා මණු බිල් ඉදිකිරීම. | 4,000,000.00 |
| 04 | බලහෙල පාරේ ටී. එම්. බණ්ඩාර මහතාගේ නිවස අසල පැති බැම්මේ ඉතිරි කොටස ඉදිකිරීම. | 400,000.00 |
| 05 | නුවරතැන්න පිට්ටනිය ආරම්භක ස්ථානයේ බෝක්කුව සකස් කිරීම. | 1,500,000.00 |
| 06. | නාරන්දණ්ඩ මාර්ගයේ අංක 55 බි නිවස පිටුපස ඉදිකළ ආරක්ෂිත බැම්මේ ඉතිරි කොටස හා මාර්ගයේ උරහිස සකස් කිරීම. | 350,000.00 |
| 07. | පිටියේගෙදර රාමචන්ද්‍රන් මාර්ගයේ කාණු පද්ධතිය සකස් කිරීම. | 400,000.00 |
| 08. | මංගල ගිරි කන්ද ජල මූලාශ්‍රයේ ආරක්ෂිත වැට හා ආධාරක කුළුණු යෙදීම. | 400,000.00 |
| 09. | දෙල්ගහපිහිල්ල මාර්ගය හා පැති බැම්ම සකස් කිරීම. | 4,000,000.00 |
| 10. | වත්තේගම මහ විද්‍යාලයේ අක්බාර් මිරිස් මෝල අසල කාණු පද්ධතිය සංවර්ධනය කිරීම. | 400,000.00 |
| 11. | යටිරාවන අලුපොතු කුඹුර මාර්ගයේ අඩි පාර කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීම. | 200,000.00 |

| | | |
|---|---|---|
| 12 | පිටියේගෙදර - රත්නැක්ගෙදර පාරේ සියඹලා ගස අසලින් ආරම්භ වන මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 200,000.00 |

1.15.4 ඉහත යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී බී.ඒ.ඩී පෙරේරා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

1.15.5 ඉන් අනතුරුව විවාද අවස්තාව එළඹී අතර එම අවස්ථාව කිසිවෙකු විසින් ලබා නොගන්නා ලදි.

1.15.6 **ඒ අනුව වත්තේගම නගර සභාවේ වැඩ අධිකාරී විසින් සකස් කරන ලද ඇස්තමේන්තු පිලිබඳ යෝජනාව සියළුම සභිකයින් ඒකමතිකව සම්මත කරන ලදි.**

2 **<u>ගරු නගර සභා මන්ත්‍රී සී.ඩී ගුරුගල්ගේ මහතාගේ යෝජනා</u>**

වත්තේගම නගර සභා බල ප්‍රදේශයේ ඇති සියළුම මාර්ග දෙපස ඝණව තණකොල වැවී ඇත. එම තණකොල ඉවත් කිරීම සඳහා නගර සභාව සතුව ප්‍රමාණවත් සේවකයන් නොමැති නිසා වල් නාශක යොදා එම තණකොල ඉවත් කිරීමට යෝජනා කරන ලදි.

2.1.1 ඉහත යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඊ.ජී.ජේ. ආරියවංශ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

2.1.2 ඉන් අනතුරුව විවාද අවස්තාව එළඹී අතර එම අවස්ථාව කිසිවෙකු විසින් ලබා නොගන්නා ලදි.

2.1.3 **ඒ අනුව වත්තේගම නගර සභා බල ප්‍රදේශයේ ඇති සියළුම මාර්ග දෙපසම ඝණව තණකොල වැවී ඇති බැවින් වල් නාශක යොදා ඉවත් කිරීම පිලිබඳ යෝජනාව සියළුම සභිකයින් ඒකමතිකව සම්මත කරන ලදි.**

3. **<u>ගරු නගර සභා මන්ත්‍රී බී.ඒ.ඩී පෙරේරා මහතාගේ යෝජනා</u>**

1. වත්තේගම බස් නැවතුම්පොල භූමියේ සහ ඒ අවට ප්‍රදේශයේ බුලත් කෙල ගැසීම හා කැලි කසල දැමීම නිරන්තරයෙන් සිදු වෙමින් පවතී. මේ පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා සුදුසු පරිදි දැන්වීම් සහ දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කිරීමට කටයුතු යොදන මෙන් යෝජනා කරන ලදි.

3.1.1 ඉහත යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී සී.ඩී ගුරුගල්ගේ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

3.1.2 ඉන් අනතුරුව විවාද අවස්තාව එළඹී අතර එම අවස්ථාව කිසිවෙකු විසින් ලබා නොගන්නා ලදි.

3.1.3 **ඒ අනුව වත්තේගම බස් නැවතුම්පොල හා ඒ අවට ප්‍රදේශය අපවිත්‍ර වීම නිසා ඒ සම්බන්ධව ජනතාව දැනුවත් කිරීම සඳහා දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කිරීම පිලිබඳ යෝජනාව සියළුම සභිකයින් ඒකමතිකව සම්මත කරන ලදි.**

2. වත්තේගම නගර සභා සීමාව තුල මාර්ග පවිත්‍ර කිරීම සඳහා තණකොළ කපන යන්ත්‍ර 02 ක් මිලදී ගැනීමට යෝජනා කරන ලදි.

3.2.1 ඉහත යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී සී.ඩී ගුරුගල්ගේ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

3.2.2 ඉන් අනතුරුව විවාද අවස්තාව එළඹී අතර එම අවස්ථාවේදී ගරු නගර සභා මන්ත්‍රී ඩී.ඩබ්.ආර්.ඩබ්.එම්.එම්.ඩබ්.ජී. එන්.විජේනායක මැතිතුමා විසින් යෝජනා කරන ලද්දේ මෙම යෝජනාව ඉතාම හොද යෝජනාවක් වන අතර එම යන්ත්‍ර මිලදී ගන්නා අවස්ථාවේදීම මෙම යන්ත්‍ර දෙක ක්‍රියා කිරීම සඳහා නව සේවකයන් දෙදෙනකුත් බඳවා ගැනීමට කටයුතු කරන ලෙසය. නැත්හොත් පැරණි යන්ත්‍ර එලෙසම තියේවි ඒ අනුව ලැබුණ සේවාවම නැවතත් ලැබේවී.

3.2.3 අනතුරුව ගරු නගර සභා මන්ත්‍රී බී.ඒ.ඩී පෙරේරා මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලද්දේ මෙම පැරණි යන්ත්‍ර නිතර නිතර කැඩෙන අතර භාවිතයට ගැනීමට නොහැකි ලෙස කාලය ඉකුත් වී ඇති බවක් පෙනෙන බවයි.

3.2.4 **ඒ අනුව වත්තේගම නගර සභා සීමාව තුළ මාර්ග පවිත්‍ර කිරීම සඳහා තණකොළ කපන යන්ත්‍ර 02ක් මිලදී ගැනීමේ යෝජනාව සියළුම සභිකයින් ඒකමතිකව සම්මත කරන ලදි.**

(ඔ) සෙසු කරුණු

1. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන

01

# 350 SHOP EHELIYAGODA

288B, Thalavitiya, Parakaduwa
Tell: 0777474276/0727474267

442
08 MAY 2026
1248
වත්තේගම

නගරාධිපති,
නගර සභාව,
වත්තේගම.
2026.05.08

**උඩුරාවන නගර සභා ක්‍රීඩාංගනය වෙන් කර ගැනීම සම්බන්ධවයි.**

ගරු නගරාධිපති තුමනි ,

අප ආයතනය මගින් දිවයින පුරා වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යන අතර එය පැවැත්වීමට මීලග නගරය ලෙස වත්තේගම නගරය තෝරාගෙන ඇත. මෙම කටයුත්ත සඳහා විශාල ඉඩ ප්‍රමාණයක් වැය වන අතර ඒ සඳහා නගර සභාවට අයත්ව තිබෙන උඩුරාවන නගර සභා ක්‍රීඩාංගනය සුදුසු බව අප ආයතනය මගින් තීරණය කර ඇති අතර මෙම වෙළඳ ව්‍යාපාරයෙන් ඉතා අඩු මිලකට භාන්ඩ ලබා ගැනීමට හැකියාව ජනතාවට හිමි වීම සහ ක්‍රීඩාංගනයේ දියුණුව උදෙසා ගෙවීමේ පදනම මත 2026 ජුනි මස 08 වන දින සිට දින 45ක කාලයකට ලබා ගැනීම සඳහා අවැසි ඉදිරි කටයුතු සලසා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

.................................
ව්‍යාපාරික
ඩබ්.ඒ.ටී.බන්දුල
දුරකථන අංකය :- 070 437 2555

02.

පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය
உள்ளூராட்சி உதவி ஆணையாளர் அலுவலகம்
OFFICE OF THE LOCAL GOVERNMENT ASSISTANT COMMISSIONER
Provincial Council Complex, (Management Development Training Unit) Ayurweda Road, Pallekele, Kundasale.

Office } 081-2213362 | Fax } 081 -2213362 | E-mail } aclgkandy@yahoo.com

My No. } CPC/ACLG/K/ AM- 04/05/ii-2026 | Your No. | Date } 2026.04 02

09 APR 2026
1103.

ගරු සභාපතිතුමා,
වත්තේගම නගර සභාව.

**අඩු ආදායම්ලාභී පවුල් 2ක් සඳහා ද්‍රව්‍ය ආධාර ලබා දීම සම්බන්ධවයි.**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබගේ අංක CPC/UCW/02/01/2025 දරණ 2026.03.16 දිනැති ලිපිය හා බැඳේ.

02. ඉහත ලිපිය සමඟ යොමු කර ඇති ඉල්ලීමේ පහත අඩුපාඩු නිරීක්ෂණය වේ.

I. විධිමත්ව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය නොමැති වීම
II. කරුණට අදාළ විධිමත් සභා සම්මුතිය නොමැති වීම.
III. ඉල්ලීමේ ලිපි සත්‍ය පිටපත් බවට සනාථ කර නොමැති වීම
IV. අදාළ පුද්ගලයන් තෝරාගත් ආකාරය හා ඊට හේතු වූ කරුණු ඇතුළත් කර නොමැති වීම.
V. කරුණට අදාළ සාධාරණීකරණ වාර්තාව නොමැති වීම.
VI. සියලු පිටපත් සත්‍ය පිටපත් බවට සනාථ කර නොමැති වීම.
VII. සියලුම ඇමුණුම් පිටපත් 04කින් යුක්තව ඉදිරිපත් කර නොමැති වීම.

03. ඒ අනුව එකී අඩුපාඩු නිවැරදිව සකසා මෙම ඉල්ලීම නගර සභා ආඥා පනතේ 159(1)(ඊ)(ල) වගන්තිය යටතේ වියදම් දැරීම සඳහා අනුමැතියට නැවත යොමු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

ඒ.ඩබ්.ජී.එල්. අත්තනායක,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
මහනුවර.

පිටපත -

01. ලේකම්, වත්තේගම නගර සභාව - කා.දැ.පි/අ.ක.ස

අපි ඔබට අත්වැලක් වන්නෙමු | நாம் உங்களுக்கு உதவும் கரமாவோம்

| | | | |
|---|---|---|---|
| පළාත් පාලන අමාත්‍යාංශය, පල්ලේකැලේ<br>உள்ளூராட்சி அமைச்சரகம் - பல்லேகலே | : 081 - 4481322 | පළාත් පාලන දෙපාර්තමේන්තුව, පල්ලේකැලේ<br>உள்ளூராட்சி திணைக்களம் - பல்லேகலே | : 081 - 2202262 |
| පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය, මාතලේ<br>உள்ளூராட்சி உதவி ஆணையாளர் - மாத்தளை | : 066 - 2233711 | පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය, නුවරඑළිය<br>உள்ளூராட்சி உதவி ஆணையாளர் - நுவரெலியா | : 052 - 2222791 |
| පළාත් පාලන පුහුණු මධ්‍යස්ථානය - නවයාලතැන්න<br>உள்ளூராட்சி பயிற்சி மத்திய நிலையம் - நவயாலதென்ன | : 081 - 2497252 | | |

03.

පළාත් පාලන දෙපාර්තමේන්තුව - මධ්‍යම පළාත

Department of Local Government - Central Province

Provincial Council Complex, Pallekele, Kundasale

මගේ අංකය / My No: CPC/C16/P/1 /(2026) | ඔබේ අංකය / Your No: | දිනය / Date: 2026.04.06

මධ්‍යම පළාතේ සියලුම පළාත් පාලන ආයතන ප්‍රධානීන් වෙත

**"සුරක්ෂිත ලංකා" ජාතික මෙහෙයුම් යටතේ**
**බලශක්ති අර්බුදය කළමනාකරණය සඳහා වන විශේෂ සාකච්ඡාව**

ඉහත කරුණ සම්බන්ධයෙන් ඔබ වෙත ද පිටපත් සහිතව සියලුම පළාත් පාලන කොමසාරිස්වරුන් අමතා ලද ජනාධිපති ලේකම්ගේ 2026.03.31 දිනැති PS/CSL/ET/02/04/Budget-2026 අංක දරන ලිපිය හා බැඳේ.

02. සියලුම පළාත් පාලන ආයතනවල ප්‍රධානීන් සමඟ 2026 මාර්තු මස 30 වැනි දින පස්වරු 8.30 ට ගරු මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගේ සහ ගරු රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලද සාකච්ඡාවේදී එළඹි තීරණ එකී ලිපිය මඟින් දැනුම් දී ඇත. ඔබේ පහසු දැනගැනීම පිණිස එම ලිපියේ පිටපතක් මේ යා කර එවමි.

03. මධ්‍යම පළාතේ ප්‍රධාන ලේකම් විසින් මේ සම්බන්ධයෙන් 2026.04.02 වැනි දින පවත්වන ලද මාර්ගගත රැස්වීමේදී මධ්‍යම පළාත තුළ බලශක්ති අර්බුදය කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් විශේෂ උපදෙස් ලබා දුන් අතර එම උපදෙස් ද සැලකිල්ලට ගනිමින් ඔබ පළාත් පාලන ආයතනයේ සහ බල ප්‍රදේශයේ සියලු ආයතන සංවිධාන හා එක්ව ප්‍රජා සංවිධානයන්ද දැනුවත් කරමින් බලශක්ති අර්බුදය කළමනාකරණය කිරීමට පියවර ගන්නා ලෙස කාරුණිකව දන්වමි. එම සැලසුම් සඳහා භාවිත කළහැකි උපායමාර්ග පිළිබඳ සටහනක් ද ඔබ ආයතනයේ අවධානය පිණිස මේ යා කර එවමි.

04. තවද එකී ලිපියෙන් දැනුවත් කර ඇති ආකාරයට සියලුම පළාත් පාලන ආයතනවල සභාපතිවරුන් සහ නාගරික කොමසාරිස්වරුන් / ලේකම්වරුන් බලශක්ති සුරක්ෂිතතා වැඩසටහනට අදාළ වට්ස්ඇප් සමූහය වෙත එම ලිපිය සමඟ ඉදිරිපත් කර ඇති QR කේතය මඟින් සම්බන්ධ වන ලෙසට ද වැඩිදුරටත් කාරුණිකව දැනුම් දෙමි.

ඒ.එම්.කේ.සී.කේ.අතපත්තු,
පළාත් පාලන කොමසාරිස්,
මධ්‍යම පළාත.

පිටපත් -
1. ජනාධිපති ලේකම් - කා.දැ.ගැ.පි.
2. ලේකම් රාජ්‍ය පරිපාලන හා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - එම
3. ප්‍රධාන ලේකම්, මධ්‍යම පළාත - එම
4. ලේකම්, ප්‍රධාන හා පළාත් පාලන අමාත්‍යාංශය(මධ්‍යම පළාත) - එම
5. පළාත් පාලන සහකාර කොමසාරිස් (මහනුවර/මාතලේ/නුවරඑළිය) - දැ.ගැ.පි. හා අ.ක.ස.

- Medarata Local Government to Serve People

Assistant Commissioner of Local Government : Kandy 081 - 2213362
Assistant Commissioner of Local Government : Nuwara-Eliya 052 - 2222...
Assistant Commissioner of Local Government : Matale 066 - 2233711
Local Government Training Centre : Nawayalathenna 081 - 24...

CamScanner

**පළාත් පාලන දෙපාර්තමේන්තුව - මධ්‍යම පළාත**

**"සුරකිමු ලංකා" ජාතික මෙහෙයුම යටතේ**

**බලශක්ති අර්බුදය කළමනාකරණ කටයුතු සැලසුම් කිරීම සඳහා සුදුසු පරිදි යොදාගැනීම පිණිස පළාත් පාලන ආයතන වෙත විශේෂ උපදෙස්**

| අ.අ. | උපායමාර්ගය | ක්‍රියාකාරකම | ඉලක්කය | 2026 ජනවාරි මාසයේ පිරිවැය | 2026 අප්‍රේල් මාසයේ අපේක්ෂිත පිරිවැය | 2026 අප්‍රේල් මාසයේ ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|
| 01 | පළාත් පාලන බල ප්‍රදේශයන්හි විදි පහන් නිවා දැමීම මගින් බලශක්තිය ඉතිරි කරගැනීම. | 1. පස්වරු 6.00 සිට රාත්‍රී 10.00 දක්වා ආසන්නයේ පිහිටි විදි ලාම්පු එකක් හැර එකක් නිවා දැමීම.<br>2. පස්වරු 10.00 සිට උදෑසන දක්වා අත්‍යවශ්‍ය නොවන විදි ලාම්පු සුදුසු පරිදි නිවා දැමීම.<br>3. රථවාහන ආරක්ෂාව සහ මහජන ආරක්ෂාව සඳහා පොලිස් ආරක්ෂාව ලබාගැනීම.<br>4. ග්‍රාමීය මාර්ගවල විදි පහන් රාත්‍රී 8.00 න් පසු සුදුසු පරිදි නිවා දැමීමට පියවර ගැනීම.<br>5. විදි පහන් නිවා දැමීම සහ දැල්වීම නියාමණය සඳහා වැඩපිළිවෙලක් සංවිධානය කර ක්‍රියාත්මක කිරීම. | කළින් පැවති විදුලිය භාවිතයෙන් 50% ක් ඉතිරි කර ගැනීම. | | | |
| 02 | පළාත් පාලන ආයතන කාර්යාල, මහජන පුස්තකාල, බස් නැවතුම්පල, සාප්පු සංකීර්ණ, පොදු වෙළෙදපල ආදි පළාත් පාලන ආයතන යටතේ පවතින ස්ථානයන්හි විදුලිය භාවිතය අවම කරගැනීම. | 1. රජය විසින් විටින් විට ගනු ලබන ප්‍රතිපත්ති තීරණවලට අනුකූලව අදාළ දිනයන්හි සියලුම කාර්යාල පරිශ්‍රයන් වසා තැබීම. විදුලිය විසන්ධි කර තැබීම.<br>2. කාර්යාලයන්හි වායු සමීකරණ, විදුලි පංකා, අනවශ්‍ය විදුලි පහන් සෑම පැයකට වරක් පැය දෙකකට නිවා දැමීම.<br>3. විදුලි සෝපාන, විද්‍යුත් පුවරු ආදිය අත්‍යවශ්‍ය අවස්ථාවල පමණක් යොදාගැනීම.<br>4. අවශ්‍ය නොවන සෑම අවස්ථාවකම දල්වන ලද විදුලි බුබුලු නිවා දැමීමට හුරු පුරුදු වීම.<br>5. බල ප්‍රදේශයේ සියලු අංශ දැනුවත් කිරීම.<br>6. අත්‍යවශ්‍ය නොවන විදුලිය භාවිතයන් උපරිම වශයෙන් අඩු කිරීම. ස්වාභාවික වාතාශ්‍රය සහ ආලෝකය භාවිත කිරීම.<br>7. සෑම විටම අඩු වෝල්ට් ප්‍රමාණයක් භාවිත වන විදුලි බල්බ භාවිත කිරීම. | කළින් පැවති විදුලිය භාවිතයෙන් අවම වශයෙන් 25% ක් ඉතිරි කර ගැනීම. | | | |
| 03 | වාහන භාවිතයේදී වැයවන ඉන්ධන ඉතිරිකර ගැනීමට කටයුතු කිරීම. | 1. එක්වරකදී එක මාර්ගයක රාජකාරි කළයුතු කිහිප දෙනෙක් එක්ව එක් වාහනයක ගමන් කිරීම.<br>2. උත්සව සහ වෙනත් අත්‍යවශ්‍ය නොවන ගමන් සුදුසු පරිදි නවතා දැමීම.<br>3. වාහන සඳහා ලබාදෙන ඉන්ධන ප්‍රමාණය සීමා කිරීම<br>4. වාහන කෙටිම මාර්ගයෙන් ධාවනය කිරීම සහ දිනකට කරන ගමන් වාර ප්‍රමාණය අවම කර ගැනීම. | කළින් පැවති විදුලිය භාවිතයෙන් අවම වශයෙන් 25% ක් ඉන්ධන ඉතිරි කර ගැනීම | | | |
| 04 | නිලධාරීන් කාර්යාලයට පැමිණීමේදී වැයවන ඉන්ධන ඉතිරි කරගැනීමට කටයුතු කිරීම. | 1. ආයතනයේ සියලුම කාර්ය මණ්ඩලය රජය විසින් කාර්යාලයට නොපැමිණීමට ලබා දී ඇති බදාදා දිනය තුළ ඉන්ධන වැයවන ගමන් බිමන්වලින් වැලකී සිටීම සහ හෝ කාර්යාලයට පැමිණීමට වැයවන ඉන්ධන ප්‍රමාණයට වඩා අඩු පරිභෝජනයක් සිදු කිරීමට වග බලාගැනීම. | කාර්යාල සහ අනෙකුත් පරිශ්‍රයන් අදාළ කාලයන්හි වසා තබමින් මාසික විදුලිය භාවිතය 5% කින් අඩු කිරීම. | | | |
| 05 | ක්ෂේත්‍ර රාජකාරි සඳහා වැයවන ඉන්ධන ඉතිරි කරගැනීමට කටයුතු කිරීම. | 1. හැකි සෑම විටම ක්ෂේත්‍ර රාජකාරි කිහිපයක් එක් දිනකට ඒකාබද්ධ කරගැනීම. | වැයවන ඉන්ධන ප්‍රමාණයේ ඵලදායීතාවය 25%කින් ඉහළ නැංවීම. | | | |

| අ.අ. | උපායමාර්ගය | ක්‍රියාකාරකම | ඉලක්කය | 2026 ජනවාරි මාසයේ පිරිවැය | 2026 අප්‍රේල් මාසයේ අපේක්ෂිත පිරිවැය | 2026 අප්‍රේල් මාසයේ ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|
| 06 | අතිකාල සේවා අවම කිරීම. | 1. සවස 4.15 සිට අතිකාල සේවාවන් හැකි පමණ සීමා කිරීම. | කළින් පැවති විදුලිය භාවිතයෙන් අවම වශයෙන් 10% ක් ඉන්ධන ඉතිරි කර ගැනීම | | - | |
| 07 | පුද්ගලික පරිභෝජනයට වැයවන ඉන්ධන සහ විදුලිය ඉතිරි කර ගැනීම. | 1. පළාත් පාලන ආයතනයේ සන්නිවේදන ක්‍රම හරහා බල ප්‍රදේශයේ ජනතාව දැනුවත් කිරීමට පියවර ගැනීම.<br>2. විද්‍යුත් හා සමාජ මාධ්‍ය , සමාජ මාධ්‍ය ජාල හරහා විවිධ ඉලක්ක කණ්ඩායම් දැනුවත් කිරීම.<br>3. ජනාධිපති කාර්යාලය මගින් Energy Crisis Management සමූහයේ පළකරන දැන්වීම් පිළිබඳව ජනතාව දැනුවත් කිරීම.<br>4. සුදුසු පරිදි සංගීත මණ්ඩයක්, කෙටි පණිවුඩයක්, හඩපටයක් වැනි ක්‍රම භාවිතයෙන් විදුලිය විසන්ධි කිරීම සඳහා වේලාවන් හෝ කාල සීමාවන් දිනපතා සිහිපත් කිරීම. | බල ප්‍රදේශයේ සාමාන්‍ය ඉන්ධන හා විදුලිය පරිභෝජනය අවම වශයෙන් 20% ක් ඉතිරිකර ගැනීම. | | | |

ඊ.එම්.කේ.සී.කේ. අතපත්තු
පළාත් පාලන කොමසාරිස්
මධ්‍යම පළාත.

2026.04.උ වැනි දින.

04.

සංවර්ධන අංශය
2026.05.13

ලේකම්තුමා මගින්,
ගරු සභාපතිතුමා ,
වත්තේගම නගර සභාව.

**<u>නගර සභා අරමුදල් යටතේ එක් මන්ත්‍රීවරයෙකු සඳහා වෙන්කර ඇති රු. 200,00 ක ප්‍රතිපාදන සීමාව තුළ ඉටු කිරීමට තීරණය කරන ලද ව්‍යාපෘතීන්</u>**

2026 වර්ෂයේ ක්‍රියාත්මක කිරීම සඳහා ගරු මන්ත්‍රීවරුන් විසින් ලබා දී ඇති යෝජනා අතරින් රු. 200,000 ක ප්‍රතිපාදන සීමාව තුළ ඉටු කළ හැකි ව්‍යාපෘති සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීවරුන් සමග සාකච්ඡා කරන ලදි. ඒ අනුව තීරණය කරන ලද යෝජනා ඇතුළත් වාර්තාව (ඇමුණුම 01) මේ සමග ඉදිරිපත් කරමි.

02. එම සංශෝධිත යෝජනා ගරු මහ සභාවේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කිරීමට අනුමැතිය ලබා දෙන මෙන් කාරුණිකව ඉල්ලමි.

පී.එම්.සී. දිල්රුක්ෂි
විෂය භාර නිලධාරී (සංවර්ධන)

# වත්තේගම නගර සභාව

## සංවර්ධන අංශය

නගර සභා අරමුදල් යටතේ එක් මන්ත්‍රීවරයෙකු සඳහා වෙන්කර ඇති රු. 200,000 ක ප්‍රතිපාදන සීමාව යටතේ ප්‍රමුඛතාවය අනුව ඉටු කිරීමට තීරණය කරන ලද ව්‍යාපෘතීන්

| අනු අංකය | මන්ත්‍රීතුමාගේ/මන්ත්‍රීතුමියගේ නම | ව්‍යාපෘතිය | වෙන් කර ඇති මුදල රු. | 2026.05.13 දිනට ප්‍රගතිය |
|---|---|---|---|---|
| 1. | ඩී.එම් මොනිකා අබේකෝන් මිය | අටලහගොඩ ප්‍රධාන මාර්ගයේ මුදුන්කොටුව මහතාගේ නිවස අසලින් යන පොදු කානුවේ ඉතිරි කොටස සංවර්ධනය කිරීම. | 200, 000.00 | ඇස්තමේන්තුව සකස් කළ යුතුයි. |
| 2. | ජේ.ජී.ශූ ගමගේ මයා | ඇල්කඩුව පාරේ නුවරතැන්න පටුමගට එහායින් ගාමිණී විජේරත්න මහතාට අයත් (අංක 54/6) ගොඩනැගිල්ල අසලින් ආරම්භ වී ඉහලට ඇති පඩිපෙල කෙලවර අඩි 60 ක දිග ප්‍රමාණයක මාර්ග කොටස අයිනේ කානුද සකසා කොන්ක්‍රීට් කිරීම සිදු කළ යුතුය | 200,000.00 | ඇස්තමේන්තුව සකස් කළ යුතුයි. |
| 3. | සී.ඩී ගුරුගල්ගේ මයා | අටලහගොඩ අඩිපාර ඉතිරිව ඇති මාර්ගය කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීම . (සෙනෙවිරත්න මහතාගේ නිවස අසලින් අවසන් වන මාර්ගය ) | 200,000.00 | ඇස්තමේන්තුව සකස් කළ යුතුයි. |
| 4. | ඒ.ජී රංජිත් ගුණවර්ධන මයා | අලුපොතුකුඹුර මාර්ගයේ අඩි පාර අඩි 4 ට කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීම. | 200,000.00 | ඇස්තමේන්තුව සකස් කර ඇත. කොන්ත්‍රාත් ප්‍රධානය කළ යුතුයි |
| 5. | ආර්. ජී.ශූ ආර්.එස් රාජමන්ත්‍රී මයා | පිටියේගෙදර රත්නාක්ගෙදර පාර අතුරු මාර්ගය සියඹලා ගස අසලින් වංශරත්න නිවස අසලින් යන අතුරු මාර්ගය අඩි 8ක් පළල අඩි 200ක මාර්ගය කොන්ක්‍රීට් කිරීම. | 200,000.00 | ඇස්තමේන්තුව සකස් කර ඇත. කොන්ත්‍රාත් ප්‍රධානය කළ යුතුයි. |
| 6. | දුමින්ද පෙරේරා මයා | පින්නලන්ද ගලදෙණිය පාර අවසන් වන ස්ථානය අසලින් නිවාස 07 කට පමණ යාමට ඇති පාර වාහනයකින් යාමට නොහැකි වන අයුරින් බැවුමක් පිහිටා ඇත. එම බැවුම අඩුකර එම මාර්ගය වාහනයක් යාමට හැකි වන අයුරින් සකස් කිරීම | 200,000.00 | ඇස්තමේන්තුව සකස් කළ යුතුයි. |
| 7. | ටී . ජී.ජේ ආරියවංශ මයා | වත්තේගම - මහනුවර මාර්ගයේ සිට ඇලදවත්ත ගමට පිවිසීමට ඇති මාර්ගය පාලම දක්වා සංවර්ධනය කිරීම. | 2000,00.00 | ඇස්තමේන්තුව සකස් කළ යුතුයි. |
| | මන්ත්‍රීතුමාගේ/මන්ත්‍රීතුමියගේ නම | ව්‍යාපෘතිය | වෙන් කර ඇති මුදල රු | 2026.05.13 දිනට ප්‍රගතිය |
| 8. | ප්‍රියන්ත පුෂ්පකුමාර මයා | අඩු ආදායම්ලාභි පවුල් 2 ක් සඳහා නිවාස සාදා ගැනීමට දව්‍ය ආධාර ලබාදීම. | 200,000.00 | අදාළ වාර්තා සමග අයදුම්පත නිවැරදිව සකස් කර ගරු ආණ්ඩුකාර තුමාගේ අනුමැතියට ඉදිරිපත් කළ යුතුයි. |
| 9. | ඒ.බී වීරකෝන් මයා | අටලහගොඩ කොට්ඨාශයේ අඹගස්තැන්න රවත්ඔය දක්වා මාර්ගය පිළිසකර කිරීම. | 200, 000.00 | ඇස්තමේන්තුව සකස් කළ යුතුයි. |
| 10. | ඩී.ඩබ්.ආර්.ඩබ්.එම්.එම්.ඩබ්.ජී.එන් විජේනායක මයා | උඩුරාවණ - හලුවන ගම්මැද්ද පාර පින්නලන්ද පාරට යාමට ඇති මාර්ගයේ ඉතිරි කොටස සංවර්ධනය කිරීම. | 200,000.00 | ඇස්තමේන්තුව සකස් කළ යුතුයි. |
| 11. | සුභද්‍රා විජේසූරිය මිය | මුදුනේගම්මැද්දට පිවිසුම් මාර්ගයේ පැති බැම්මේ ඉතිරි කොටස ඉදිකිරීම. | 200,000.00 | තාක්ෂණ නිලධාරී විසින් පරීක්ෂා කර ඇත ඇස්තමේන්තු සකස් කරමින් පවතී . |
| 12. | අයි.එම්.එස් රුවන්දි රණසිංහ මිය | වරකාගස්තැන්න ග්‍රාමයේ නන්දසෝම මහතාගේ නිවස අසලින් පහලට ඇති මාර්ගයේ ඇලෙන් මෙගොඩ කොටසක් කොන්ක්‍රීට් දමා පිළිසකර කිරීම. | 200,000.00 | ඇස්තමේන්තුව සකස් කළ යුතුයි. |
| 13. | ඩබ්ලිව් . ටී. රාජමන්ත්‍රී මයා | නාරංදෙණිඩ පාර සමග දිවෙන කාණු පද්ධතිය නිසි ලෙස ජලය ගලා නොබසින බැවින් විශාල ප්‍රශ්න රාශියක් මතු වී ඇති බැවින් එම කාණු පද්ධතිය නිසි ලෙස ජලය ගලා යන ලෙස සැකසීම. | 200, 000.00 | ඇස්තමේන්තුව සකස් කළ යුතුයි. |
| 14. | ඩී.ඩබ්.පී අනුර කුමාර මයා | මහවිද්‍යාල පාරේ ගලහිටියාව මහතාගේ නිවස අසල සිට කුමාරවෙල් පවනන් (140/D නිවස ) මහතාගේ නිවස දක්වා කාණුව අඩි 40 ක් (පළල 8) කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීම. | 200000.00 | ඇස්තමේන්තුව සකස් කළ යුතුයි. |
| 15. | ඒ.පී.සී.ආර්. ජයවීර මන්ත්‍රීතුමා | රුවන්ගලේ ගම සිසිර කිමාරසිංහ මයාගෙ නිවස අසලින් ආරම්භවී යටිරාවන වෙල්යාය දක්වා වන වැසි ජල කාණුව සංවර්ධනය කිරීම. | 200,000.00 | ඇස්තමේන්තුව සකස් කළ යුතුයි. |
| | | වෙන් කර ඇති මුළු මුදල රු. | 3,000,000.00 | |

05

ක්ෂේත්‍ර නිරීක්ෂණ වාර්තාව

වත්තේගම නගර සභා ආදාහනාගාර පරිශ්‍රය අලංකරණය කිරීම

**01. හැඳින්වීම:** මධ්‍යම පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ උපදෙස් පරිදි (ලිපි අංක: CPC/MA/4/6/5/Env/Comm/2026), පේරාදෙණිය උද්භිත උද්‍යානයේ තාක්ෂණික සහාය ඇතිව වත්තේගම නගර සභා ආදාහනාගාර පරිශ්‍රය විධිමත් ලෙස අලංකරණය කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි.

**02. නිරීක්ෂණ චාරිකාව පිළිබඳ තොරතුරු:** ව්‍යාපෘතියේ මූලික සැලසුම් සකස් කිරීම සඳහා පේරාදෙණිය උද්භිත උද්‍යානයේ නිලධාරියෙකු ඇතුළු කණ්ඩායමක් සමඟ පවත්වන ලද ක්ෂේත්‍ර නිරීක්ෂණ චාරිකාව පහත පරිදි සිදු විය.

- දිනය: 2026 මැයි මස 06 වන දින

**සහභාගී වූ පිරිස:**

- **ඩී.එස් උයන්ගොඩ මයා - ගරු සභාපති**
- **ජේ.ඒ.යූ. ගමගේ මයා - ගරු උප සභාපති**
- **බී.ඒ. දුමින්ද පෙරේරා මයා - ගරු නගර සභා මන්ත්‍රී**
- **ඊ.ජී. ජයතිලක ආරියවංශ මයා - ගරු නගර සභා මන්ත්‍රී**
- **ඩී.බී. වස්ගේවත්ත මයා - ලේකම්**
- **චමින්ද රත්නායක මහතා (කෘෂිකර්ම ප්‍රදේශක - පේරාදෙණිය උද්භිත උද්‍යානය)**
- **අනුෂා නානායක්කාර මිය - පරිසර හා සෞඛ්‍ය විෂයභාර නිලධාරී**

**03. ලබාදුන් තාක්ෂණික උපදෙස් සහ තීරණ:** පරිශ්‍රය අලංකරණය කිරීම සඳහා උද්භිත උද්‍යාන නිලධාරී චමින්ද රත්නායක මහතා විසින් පහත මාර්ගෝපදේශ ඉදිරිපත් කරන ලදී:

- **මූලික සිතියම සකස් කිරීම:** ආදාහනාගාර පරිශ්‍රයේ වර්තමාන භූමි සැකසුම දැක්වෙන නිවැරදි සිතියමක් (Site Plan) කඩිනමින් පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය.
- **පරිශ්‍රය පවිත්‍ර කිරීම:** දැනට වල් බිහිවී ඇති කොටස් පිරිසිදු කර, පිරිසිදු කිරීමෙන් පසු භූමියේ පවතින ස්වභාවය දැක්වෙන ඡායාරූප ඔහු වෙත යොමු කළ යුතුය.
- **තාක්ෂණික සැලසුම්:** ඉහත තොරතුරු ලබාදීමෙන් පසු, භූමියට ගැළපෙන පැල වර්ග සහ භූමි අලංකරණ ආකෘතිය (Landscape Design) පිළිබඳ සම්පූර්ණ මඟපෙන්වීම උද්භිත උද්‍යානය මඟින් ලබා දෙනු ඇත.
- **මානව සම්පත් පුහුණුව:** මෙම උද්‍යානය දිගුකාලීනව නඩත්තු කිරීමේ අරමුණින්, නගර සභාවේ සේවකයින් දෙදෙනෙකු (02) උද්‍යාන අලංකරණය පිළිබඳ විශේෂ පුහුණුවක් සඳහා පේරාදෙණිය උද්භිත උද්‍යානය වෙත යොමු කිරීමට තීරණය විය.

**04. ඉදිරි ක්‍රියාමාර්ග (Action Plan):**

1. නගර සභා තාක්ෂණික අංශය මඟින් භූමි සිතියම සකස් කිරීම.
2. සෞඛ්‍ය අංශය මඟින් භූමිය පවිත්‍ර කර ඡායාරූප නිලධාරියා වෙත යොමු කිරීම.
3. පුහුණුව සඳහා තෝරාගත් නිලධාරීන් දෙදෙනා නිල වශයෙන් පේරාදෙණිය උද්භිත උද්‍යානය වෙත යොමු කිරීම.

**ක්ෂේත්‍ර නිරීක්ෂණ වාර්තාව: ළමා උද්‍යානය සහ RDB බැංකුව අසල භූමිය සංවර්ධනය කිරීම**

**01. වත්තේගම ළමා උද්‍යානය නවීකරණය කිරීම:** ආදාහනාගාර පරිශ්‍රය නිරීක්ෂණය කිරීමෙන් අනතුරුව, පේරාදෙණිය උද්භිත උද්‍යාන නිලධාරී (කෘෂිකර්ම උපදේශක) වමින්ද රත්නායක මහතා විසින් වත්තේගම ළමා උද්‍යාන පරිශ්‍රය ද විශේෂ නිරීක්ෂණයකට ලක් කරන ලදී. එහිදී උද්‍යානය නවීකරණය කිරීම සම්බන්ධයෙන් පහත එකඟතාවලට එළඹුණි:

- **මූලික සැලසුම (Map):** නවීකරණ කටයුතු ආරම්භ කිරීමට ප්‍රථමයෙන් ළමා උද්‍යානයේ වර්තමාන ස්වභාවය දැක්වෙන සිතියමක් (Map) සකස් කර ඉදිරිපත් කළ යුතුය.
- **ඡායාරූප ඉදිරිපත් කිරීම:** සිතියම සමඟ උද්‍යානයේ වර්තමාන තත්ත්වය පැහැදිලි වන පරිදි ගනු ලැබූ ඡායාරූප පෙළක් ඔහු වෙත යොමු කිරීමට තීරණය විය.
- **භූමි අලංකරණ සැලසුම (Landscaping Design):** ඉහත තොරතුරු ලබාදීමෙන් පසු, උද්‍යානයට ගැළපෙන ආකර්ෂණීය භූමි අලංකරණ සැලසුම (Landscaping plan) ඔහු විසින් සකස් කර එවන බව දැනුවත් කරන ලදී.

**02. . (RDB) බැංකුව පිටුපස හිස් භූමිය සංවර්ධනය කිරීම:** ළමා උද්‍යානය අසල පිහිටි ආර්.බී. (RDB) බැංකුව අසල ඇති නගර සභාවට අයත් හිස් භූමිය ප්‍රයෝජනයට ගැනීම පිළිබඳව ද මෙහිදී සාකච්ඡා විය.

- **වෙළඳ කුටි ස්ථාපිත කිරීම:** එම භූමියේ වටිනාකම සහ පිහිටීම සලකා බලා, එහි ක්‍රමවත් ලෙස වෙළඳ කුටි (Kiosks/Shops) කිහිපයක් ස්ථාපිත කිරීමේ හැකියාව පිළිබඳව මූලික අවධානය යොමු විය.
- **භූමි සැලසුම් (Mapping):** මෙම භූමියේ ද සිතියමක් (Map) සකස් කර ඉදිරිපත් කරන ලෙස උපදෙස් ලැබුණු අතර, එමඟින් වෙළඳ කුටි සඳහා වෙන් කළ හැකි ඉඩ ප්‍රමාණය සහ ඉතිරි භූමිය අලංකරණය කරන ආකාරය පිළිබඳ තාක්ෂණික මඟපෙන්වීම් ලබා දීමට නියමිතය.

**03. නිගමනය සහ ඉදිරි පියවර:** නගර සභාව මඟින් ආදාහනාගාර පරිශ්‍රය, ළමා උද්‍යානය සහ බැංකුව අසල භූමිය යන ස්ථාන තුනෙහිම සිතියම් (Maps) සකස් කර, අදාළ ඡායාරූප ද සමඟ පේරාදෙණිය උද්භිත උද්‍යාන නිලධාරී වෙත යොමු කිරීමට පියවර ගත යුතුය.

2. කාරක සභා වාර්තා සලකා බැලීම
   I. 2026.04.21 දින පැවති නිවාස හා ප්‍රජා පහසුකම් කාරක සභාවේ වාර්තාව.
   II. 2026.04.21 දින පැවති පරිසර හා සෞඛ්‍ය කාරක සභාවේ වාර්තාව.
   III. 2026.04.22 දින පැවති කර්මාන්ත, ජල හා විදුලි කාරක සභාවේ වාර්තාව.
   IV. 2026.04.28 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේ වාර්තාව.

3. මන්ත්‍රීවරුන්ගේ නිවාඩු අවසරය - නැත

4. පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම.

   1. <u>එච්. ප්‍රියන්ත පුෂ්ප කුමාර මැතිතුමා</u>
      ගරු සභාපතිතුමනි දැන් ආයෙම හැම පාරකම වල් වැවිලා තියෙන්නේ.ඒ නිසා වාහන අනතුරු වෙන්න පුළුවන්, අනතුරුදායක ගස් පිහිටලා තියෙනවා ඒවාගෙන් මගීන්ට හා වාහන වලට අනතුරු වෙන්න පුළුවන්. ඒ නිසා මහා මාර්ග අධිකාරියට හා පළාත් සභාවට මේ බව දැන්මිදෙන ලෙස මා ඉල්ලා සිටිනවා.
      ඒ වගේම සභාපතිතුමනි මන්ත්‍රිවරුන් සඳහා මෙම වසරට තවත් ලක්ෂ 02ක මුදල් ප්‍රතිපාදනයක් ලබා දෙන ලෙස මම යෝජනා කරනවා.

2. ඩී.ඩබ්.ආර්.ඩබ්.එම්.එම්.ඩබ්.ජී. එන්.විජේනායක මැතිතුමා
   ගරු සභාපතිතුමනි මේ දිනවල වීධි පහන් නොදැල්වීම ගැන ජනතාව අපෙන් ප්‍රශ්ණ කරන්න ගත්තා නමුත් පවතින බලශක්ති අර්බුදයත් සමඟ මේලෙස විදුලි පහන් නිවා දමන බවට අපි ජනතාව දැනුවත් කර නුමුත් දැන් දැන් ඇතැම් වීධි වල පහන් දන්වලා තියෙනවා ඉතින් ජනාතාව මේ පිළිබඳව අපෙන් විමසනවා. දරුවන්ට, කාන්තාවන්ට ගමන් කරන්න අපහසුයි, හොරු බිහිවීමේ අවදානමක් පවතිනවා, ආරක්ෂාවක් නෑ යන මැසිවිලි නගනවා. ඒ අනුව රාත්‍රි 10.00 වන තෙක් විදුලි ආලෝකය ලබා දෙන මෙන් මම ඉල්ලා සිටිනවා.

   ඒ වගේම සභාපතිතුමනි නගරය තුළ ඇතැමුන් උදේ 7.00-8.00 වන විට වාහන මාර්ගය දෙපස නවතලා යනවා ඒ වාහන ඉවත් කරගන්නේ නැවත රාත්‍රි වෙලා. ඇතැමුන් දුර බැහැර රාජකාරී සඳහා මෙලෙස වාහන නවතා යනවා. ඒ අනුව මේ සඳහා සුදුසු ක්‍රියාමාර්ගයක් ගන්නා මෙන් මා ඉල්ලා සිටිනවා
   ගරු නගර සභා මන්ත්‍රී ප්‍රියන්ත පුෂ්පකුමාර මැතිතුමා පැවසූ පරිදි මාර්ග වල වල් වැවිලා තියෙනවා. ඒ අනුව මාස 3-4 කට සැරයක්වත් පවිත්‍ර කිරීමට කටයුතු කරන මෙන් ඉල්ලා සිටිනවා.
   ඒ වගේම ගරු සභාපතිතුමනි පවතින ජල ගැටළුව. ඇතැම් ජනතාව විමසනවා මෙච්චිර වැහැලත්ඇයි වතුර නැත්තේ කියලා. ඒ අනුව යම් කාල සටහනක් සකසා එක් ප්‍රදේශයකට දින 2-3 කට වරක් හෝ පානීය ජලය ලබාදෙන්න කටයුතු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

3. ඒ.එම්. මොනිකා අබේකෝන් මැතිනිය
   ගරු සභාපතිතුමනි CGR මාර්ගය පවිත්‍ර කර ගැනීමේ අවශ්‍යතාවයක් පවතිනවා. මොකද සති පොළ තියෙන නිසා එම ස්ථානයේ බයිසිකලයක් හරි නවතාගැනීමේ අවස්ථාව තිබෙන බැවින්

   ඒ වගේම සභාපතිතුමනි ළමා පුස්තකාලය ඉදිරිපිට පාර මාරු වීම සඳහා කහ ඉරක් නෑ.ඒ අදාල ආයතන වෙත දැනුම් දීමක් කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

   අටලහගොඩ මාර්ගයේ නාරම්පනාව මහතාගේ නිවස අසල පස් කන්දක් ඇවිල්ලා තියෙනවා. එය තවමක් ඉවත් කර නොමැති බැවින් කාණුව පිරිලා තියෙන්නේ ඉතින් නාරංපනාව මහතාගේ ගෙදර අසල කාණුව අවහිර වීම නිසා එම මාර්ගය දිගේ තමා වතුර ටික ගලාගෙන යන්නේ. ඉතින් මෙම කාණුව ශුද්ධ කරලා දෙන මෙන් මා ඉල්ලා සිටිනවා.

   ඒ වගේම ගරු සභාපතිතුමනි අනතුරුදායක පොල් ගහ ඉවත් කිරීමට කටයුතු කරන මෙන් මා නැවත වාරයක් ඉල්ලා සිටිනවා

4. අයි.එම්.එස්.ආර්. රණසිංහ මැතිනිය
   ගරු සභාපතිතුමනි ග්‍රැන්ට් පාරට සතියක්ම වතුර ගිහිල්ලා නෑ. ඒ පිළිබඳව සොයා බලන මෙන් ඉල්ලා සිටිනවා.

   ඒ වගේම අයි.එන්.එස් පාසල ඉදිරිපිට මාර්ගයේ කාණුව අවහිර වීම හේතුවෙන් මාර්ගය යට වෙනවා. මෙම මාර්ගය ආර්.ඩී.ඒ එකට අයිති මාර්ගයක් . ඒ පිළිබඳවත් සොයා බලන මෙන් මම ඉල්ලා සිටිනවා.

5. <u>ඩී.ජී.එස්. විජේසූරිය මැතිනිය</u>
   ගරු සභාපතිතුමනි මුදුනේගම්මැද්ද මාර්ගයේ කම්බි දැල හදලා දුන්නා ඒ පිළිබඳව මාගේ ස්තූතියි, ඒ වගේම මගේ නිවසේ ජල බිල්පතත් වැරදි ලෙස තමා පෙන්නුම් කරන්නේ ඉතින් මේ පිළිබඳව සොයා බැලීමක් කරන මෙන් මා ඉල්ලා සිටිනාව.
6. <u>ඩී.පී.ඩබ්.ජී අනුර කුමාර මැතිතුමා</u>
   ගරු සභාපතිතුමනි විද්‍යාදර්ශන පිරිවෙන තුළට කසල ලබා ගන්න අපේ ට්‍රැක්ටරය යන්නේ නෑ. මේ සඳහා සුදුසු වැඩ පිළිවෙලක් යොදන මෙන් ඉල්ලා සිටිනවා.

7. <u>ආර්.ජී.යූ.සෙතානී රාජමන්ත්‍රී මැතිතුමා</u>
   ගරු සභාපතිතුමනි වාර්ථාකරනයේ අඩුපාඩු තියෙනවා අපි ඒවා නිවැරදි කරගන්න කටයුතු කිරීම මඟින් කාලය ඉතිරි කර ගන්න පුළුවන්.

   ඒ වගේම පුංචිමෝල ජල ටැංකිය සඳහා දැලක් ගහන්න කිව්වා එහි වර්ථමාන තත්වය දැනගන්න කැමතී.

   ඒ වගේම මන්ත්‍රිවරුන්ගේ වාහන නවතා තබා ගැනීමට සුදුසු ස්ථානයක් තිබුනොත් හොදයි කියලා මම යෝජනා කරනවා.

   ආදාහනාගාරය වගේම නගර සභා භූමිය අලංකාර කිරීමට ක්‍රමවේදයක් යෙදුවොත් හොදයි කියලා මම යෝජනා කරනවා

   පවතින ජල ගැටළුව නිරාකරණය කිරීමට යම් වැඩපිළිවෙලක් යොදන මෙන් ඉල්ලා සිටිනවා. ඒ වගේම මම යෝජනා කරනවා ජල නල පද්දතිය යම් සිතියමක් මගින් දැක්වීමටත්, අදාල උපකරණ එම ස්ථානයේම තැම්පත් කර ඉන්වෙන්ට්‍රි ගත කිරීමේ වැඩපිළිවෙලක් සකස් කිරීම සුදුසයි බවට.

5. ගරු සභාපතිතුමාගේ පැහැදිලි කිරීම.
   1. මෙම නගරයේ ඇතැම් මාර්ග RDA, PRDA හා ඇතැම් මාර්ග ප්‍රාදේශීය සභා. නගර සභාවේ මාර්ග වලට කාල සටහනකට අනුව කටයුතු සිදු වෙමින් පවතිනවා. ඒ වගේම RDA මාර්ග සඳහා දැනුවත් කිරීමක් කරලා තියෙනවා. ඒ අනුව කඩිනම් පියවර ගන්නත් ඔවුන් කටයුතු කරන බවට දැනුම් දීලා තියෙනවා. PRDA මාර්ග සඳහා දැනුම් දීමක් සිදු කරන්න කටයුතු කරන්නම්.

   2. පවතින බලශක්ති අර්බුදයත් සමඟ අපි වීදි පහන් නිවා දමන්න කටයුතු කරා. නමුත් යම් විශේෂ අවස්ථා වලදී යම් යම් මාර්ග වලට විදුලි ආලෝකය ලබා දෙන්න කටයුතු කරා. ඒ අනුව විශේෂ අවස්ථා තියෙනවානම් කියන්න ඊට සුදුසු වැඩ පිලීවෙලක් යොදන්න කටයුතු කරන්නම්.

   3. තණකොළ කපන යන්ත්‍ර ගැන යෝජනාවක් ආවා ඒ අනුව අපි යන්ත්‍ර 02ක් ගන්න කටයුතු කරමු.
   4. ඒ වගේම අපේ මන්ත්‍රිතුමා කිව්වා වගේ වාහන නතර කරන එක ගැන සොයා බැලීමක් කරන්නම්.ඒ වගේම ඒ පුද්ගලයන් පිළිබඳව තොරතුරක් ලබා දෙන්න මම නීතිමය පියවර ගන්න කටයුතු කරනවා.

5. ඒ වගේම ජල ගැටළුවක් තියෙනවා ඒ සඳහා පද්දතියේ ගැටළුවක් තියෙන්නේ ඉතින් අපිට ක්ෂණික පිලියමකට යන්න බෑ. අපි මේක නිරාකරනය කරගන්න බලමු.

6. ඒ වගේම පන්සල් වල කුණු ගන්න යන්නේ නැත්තතේ වෙන් කිරීමකින් තොරව සියළුම කුණු පටවනවා කියලා චෝදනා ඇවිත් තියෙනවා. අපි බලමු මේ සඳහා සුදුසු පිලියමක් යොදන්න මොකද හාමුදුරුවරුන්ට කුණු අරගෙන එහා මෙහා යන්නත් බැනේ. ඒ නිසා අපි හාමුදුරුවරුන්ට කියමු කසල වෙන් කරලා ලබා දෙන්න කියලා.

(ක) මාසික අයවැය සටහන් හා කර්මාන්ත පිළිබඳ ප්‍රගති වාර්තා හා වෙනත් ලිපි

1. 2026 මාර්තු මසට අදාල ආදායම් වියදම් වාර්තාව.
2. 2026 මාර්තු හා අප්‍රේල් මසයන් සඳහා ආදායම් රැස් කිරීමේ ප්‍රගතිය.
3. 2026.03.24 දින සිට 2026.04.23 දින දක්වා නගර සභාවේ වැය පිළිබඳ විස්තරය (මුදල් කමිටු වාර්තාවේ ඇමුණුම 01)
4. 2026.03.16 සිට 2026.04.15 දක්වා ඉන්දන වාර්තාව (මුදල් කමිටු වාර්තාවේ ඇමුණුම 02)

**සභාවේ නිමාව**

ගරු සභාපති ඩී.එස්.උයන්ගොඩ මැතිතුමා විසින් සභාවේ කටයුතු ප.ව 12.10 ට අවසන් කරන ලදි.

ඩී.එස්. උයන්ගොඩ
සභාපති
වත්තේගම නගර සභාව

....................................... දින පැවති මාසික මහා සභාවේ වාර්තාව සභා සම්මත කිරීම

සංශෝධන

.................................................................................................................................
.................................................................................................................................
.................................................................................................................................
.................................................................................................................................
.................................................................................................................................
.................................................

2026 ..................... මස.......................වන දින පැවති, 2026 ..................මස මාසික මහා සභාවේ රැස්වීම් වාර්තාව ගරු නගර සභා උප සභාපති/ ගරු නගර සභා මන්ත්‍රී ...................................................................... මැතිතුමාගේ යෝජනාවෙන් හා ගරු නගර සභා උප සභාපති/ ගරු නගර සභා මන්ත්‍රී ............................................................... මැතිතුමාගේ ස්ථිරත්වයෙන් 2026 ................. මස ................. දින පැවති මහා සභාවේදී ඒකමතිකව සභා සම්මත කරන ලදි.

ඩී.එස්. උයන්ගොඩ
ගරු සභාපති
වත්තේගම නගර